# බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
# ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය

# පුරප්පාඩු දැන්වීමයි

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයේ කාන්තා නේවාසිකාගාර පාලිකා තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික කාන්තා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| **තනතුරු නාමය** | **නේවාසිකාගාර පාලිකා** |
|---|---|
| **සේවා ගණය** | කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 (MN 1 - 2025) |
| **වැටුප් පරිමාණය** | රු.45,230-10X540 - 11X630 - 10X890 - 10X1,190 - 78,360 |
| **වයස් සීමාව** | අවුරුදු 25ට නොඅඩු අවුරුදු 40ට නොවැඩි විය යුතුය. |
| **බඳවා ගැනීමේ ක්‍රමය** | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය |
| **බඳවා ගැනීමේ ශ්‍රේණිය** | නේවාසිකාගාර පාලිකා IIIශ්‍රේණිය සඳහා පමණි. |

**01. අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්**

(අ) අධ්‍යාපන සුදුසුකම් :

I. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් සමත් වී තිබිය යුතුය.

II. අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී විෂයයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම්: විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(ඇ) පළපුරුද්ද : රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයක සහකාර නේවාසිකාගාර පාලිකා ලෙස අවම වශයෙන් මාස 06ක පළපුරුද්ද

(ඇ) කායික සුදුසුකම්

ශ්‍රී ලාංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඉ) වෙනත් සුදුසුකම්

I. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

II. 2026.04.27 දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

III. ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතුය.

| **පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **තෝරා ගනු ලැබීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ. උපරිම ලකුණු ලබාගත් අයදුම්කාරිය තෝරා ගනු ලැබේ. |
| අතිරේක පළපුරුද්ද | 25 | |
| වෘත්තීය සුදුසුකම් | 25 | |
| භාෂා ප්‍රවීනතාව | 10 | |
| පරිගණක හැකියාව | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 5 | |
| එකතුව | 100 | |

**සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි**

I. දැනට පුරප්පාඩුව පවතින්නේ පැලවත්ත, බත්තරමුල්ල පිහිටි ජනකලා කේන්ද්‍රයේ කාන්තා නේවාසිකාගාරයට අදාළවය.එම ස්ථානයේ සේවයෙහි නිරත කරවනු ලැබේ.

II. පත්කරනු ලබන තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්ති තීරණ වලට යටත්වේ.

III. මෙම පත්වීම තුන් වසරක පරිවාස කාලයකට යටත් වේ. බඳවාගෙන පළමු වසර තුන ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ විධි විධානවලට ද, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණය (MN 1 - 2025) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට ද, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම් නිකුත් කරනු ලබන චක්‍රලේඛ පොදු විධි විධානවලට ද, මෙම පත්වීම යටත් වේ.

V. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්කිරීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

**අයදුම්කරන ආකාරය :** සියලු අයදුම්කරුවන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ වෙබ් අඩවියට මෙම දිගුව භාවිතයෙන් පිවිසීම මගින් https://mbrc.gov.lk/index.php/en/downloads/others එහි පළකර ඇති අයදුම්පත භාගත කර ගත හැකිය. එම PDF ගොනුව A4 සුදු කඩදාසිවල මුද්‍රණය කර සිය අත්අකුරින් සම්පූර්ණ කිරීම හෝ එම අයදුම්පතට අනුකූල වන ලෙස A4 සුදු කඩදාසිවල පිළියෙල කරගත් අයදුම්පතක් සිය අත්අකුරින් පැහැදිලිව සම්පූර්ණ කිරීම සිදුකර අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර "නේවාසිකාගාර පාලිකා තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කර 2026.04.27 දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි අධ්‍යක්ෂ, ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ලේකම්,**
**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,**
**සෙත්සිරිපාය,**
**බත්තරමුල්ල.**

**(මෙම QR කේතය Scan කර අයදුම්පත බාගත කරගත හැකිය.)**